දිවි තොර කරගැනීමක් හෝ ඊට තැත් කිරීමක් පසුපස සංකීර්ණ වූ මානසික කරුණු හා මනෝභාවයන් තිබිය හැක. එය ඝාතනයකට පසුව සිදු වන දිවි තොර කර ගැනීමට තැත් කිරීමක් වුවද, ඒ දෙස සහකම්පනයෙන් යුතුව බැලීමත්, එම සිදුවීමට අදාළ අයවලුන්ට ව්‍යංගයෙන් හෝ දෝෂාරෝපණය නොකිරීමත් අවශ්‍ය වේ. මන්ද යත්, දිවි තොර කර ගැනීමේ නැඹුරුතාවයන් යුත් තවත් අයෙකු ඊට සමාන අනුකාරක සිදුවීම් වලට පෙළඹීමේ ඉඩ අවම කිරීමේ වගකීමද අප අත පවතින බැවිණි.

වත්තල ප්‍රදේශයේ සිදු වූ ඝාතන දිවි තොර කර ගැනීමේ ප්‍රයත්නයක්, රූපවාහිනී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් (ජූනි 16, 2022) මඟින් සහ සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් (ජූනි 17, 2022) මඟින් වාර්තා කරන්නට යෙදුණු ආකාරය මෙහිදී සලකා බලමු.

• එහිදී බොහෝ මාධ්‍ය හදිසි උපකාරක අංක පළ කර නොතිබූ අතර, ඉංග්‍රීසි භාෂා පුවත්පත් කිහිපයක් පමණක් (Ceylon Today, Daily Mirror, The Morning) එම පුවත් වාර්තා සමඟින් හදිසි උපකාරක අංක පළ කරන්නට යෙදී තිබිණි.

• උපකාරක අංක පළ කර නොතිබූ බොහෝ මාධ්‍ය වාර්තාවන්, මෙම සිදුවීම දෙසත්, දිවි තොර කර ගැනීමට කළ උත්සාහය දෙසත්, එය මානසික සෞඛ්‍යය සම්බන්ධයෙන් වන ගැටළුවක් ය යන කෝණයකින් බලා නොතිබූ බවද නිරීක්ෂණය කළ හැකි විණි.

• ඒ හැරෙන්නට ඇතැම් මාධ්‍ය විසින් වක්‍රාකාරයෙන් ඝාතන දිවි තොර කර ගැනීමේ උත්සාහයට අදාල කාන්තාවට ව්‍යංගයෙන් දෝෂාරෝපණය එල්ල කොට තිබූ බවද නිරීක්ෂණය කළ හැකි විණි.

සමාජය දැඩි ආර්ථික අර්බුදයකට හසුවී තිබෙන වර්තමානයේදී විශේෂයෙන්ම දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටලුවක් ලෙසින් දැකීමත්, ප්‍රවේසම්කාරී ලෙස එම වාර්තාවන් ඉදිරිපත් කිරීමත් මාධ්‍ය අත ඇති වගකීමක් බවද බව ද මෙසේම සඳහන් කරමු.

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)